යුද සේනාවක් හෝ පිරිසක් සටන් වැද (සතුරා විසින් දමා ගිය) යුද සම්පත් රැගෙන සුරක්ෂිතව පැමිණෙන්නේ ද ඔවුන්ගේ ප්රතිඵලවලින් තුනෙන් දෙකක් පෙරාතුවම ලබනු මිස නැත. එමෙන්ම යුද සේනාවක් හෝ පිරිසක් කිසිවක් නොලබා අනතුරකට පත් වන්නේ නම් ඔවුන්ගේ ප්රතිඵල ඔවුනට පූර්ණව පිරිනමනු ලබනු මිස නැත.

අබ්දුල්ලාහ් ඉබ්නු අම්ර් ඉබ්නු අල්-ආස් -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන
ලදී. “යුද සේනාවක් හෝ පිරිසක් සටන් වැද (සතුරා විසින් දමා ගිය) යුද සම්පත් රැගෙන සුරක්ෂිතව පැමිණෙන්නේ ද ඔවුන්ගේ ප්රතිඵලවලින් තුනෙන් දෙකක් පෙරාතුවම ලබනු මිස
නැත. එමෙන්ම යුද සේනාවක් හෝ පිරිසක් කිසිවක් නොලබා අනතුරකට පත් වන්නේ නම් ඔවුන්ගේ ප්රතිඵල ඔවුනට පූර්ණව පිරිනමනු ලබනු මිස නැත.“ [පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් මුස්ලිම් එය වාර්තා කර ඇත]

මෙම හදීසයට අර්ථ දෙකක් ඇත. පළමුව: සෑම යුද පිරිසක්ම සතුරා සමග සටන් වැදී පසුව ඔවුන්ගෙන් සුරක්ෂිත වී ඔවුන් විසින් දමා ගිය යුද සම්පත් ලබන්නේ ද එවිට සුරක්ෂිත නොවූ හෝ සුරක්ෂිත වුව ද යුද සම්පත් නොලැබුණු සෙසු පිරිස්වලට වඩා ඔවුන්ගේ ප්රතිඵල අඩු වනු ඇත. මෙය ඉමාම් නවවි තුමා වඩාත් සුදුසු අර්ථය යැයි පවසා සිටියි. දෙවැනුව: ඉබ්නු අබ්දුල් බර් - රහිමහුල්ලා පවසන පරිදි ඝනීමත් සම්පත් ලැබීමෙන්, හිමිවන්නට ඇති ප්රතිඵලවල අඩුවක් නොවන බව හදීසය පෙන්වා දෙයි. එහිදී ඝනීමත් ලබන්නා හා නොලබන්නා යන දෙදෙනා අතර සමසේ පිහිටන අයුරින් ඇතැම් ප්රතිඵල පෙරාතුවම ලබා දෙනු ඇත. ඝනීමත් ලබන්නා ඔහුගේ ප්රතිඵලයෙන් තුනෙන් දෙකක් කල් ඇතිවම ඔහු ලබනු ඇත. ඒ දෙක අපි මුළුමණින්ම සලකා බලන විට එක හා සමානය. ඝනීමත් නොලබන්නාට මෙලොවෙහි අහිමි වූ එම ඝනීමත්හි ප්රමාණයට මතුලොවෙහි පිරිනමනු ඇත. අල්ලාහ් අභිමත කරන අයට ප්රගුණ කර දෙයි.

https://sunnah.global/hadeeth/si/show/6392